**ශීර්ෂය 110 - අධිකරණ අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2013 වර්ෂය**

---

මෙම වාර්තාව කොටස් දෙකකින් සමන්විත වේ.

1. කොටස - අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවල ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව
2. කොටස - එක් එක් ශීර්ෂයට අදාල විස්තරාත්මක වාර්තාව

**1 කොටස**

**අධිකරණ අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවල ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව**

---

**1. අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු**

| ශීර්ෂය | දෙපාර්තමේන්තුව |
|---|---|
| 228 | අධිකරණ පරිපාලනය |
| 231 | ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව |
| 233 | රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව |
| 234 | ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් |
| 235 | නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව |

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම්**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු 05 ක් සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.6,122,565,051 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.5,927,404,741 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා එක් එක් දෙපාර්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් රු.2,223,474 ත් රු.124,010,878 ත් අතර පරාසයක ප්‍රමාණයකින් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 2.28 ත් සියයට 21.38 ත් අතර පරාසයක ප්‍රමාණයක් පැවතුණි. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂය | 2013 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. | රු. | රු. | |
| 110 | 809,300,000 | 790,873,344 | 18,426,656 | 2.28 |
| 228 | 4,795,908,625 | 4,671,897,747 | 124,010,878 | 2.58 |
| 231 | 10,400,000 | 8,176,526 | 2,223,474 | 21.38 |
| 233 | 372,556.426 | 335,576,177 | 36,980,249 | 9.93 |
| 234 | 118,100,000 | 107,168,683 | 10,931,317 | 9.25 |
| 235 | 16,300,000 | 13,712,264 | 2,587,736 | 15.87 |
| **එකතුව** | **6,122,565,051** | **5,927,404,741** | **195,160,310** | **3.19** |

**2.2 අත්තිකාරම් ගිණුම්**

**2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තු 05 කට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 11001 | 11,000,000 | 11,906,776 | 5,800,000 | 10,844,428 | 48,000,000 | 33,522,929 |
| 22801 | 348,000,000 | 347,826,846 | 166,000,000 | 192,782,705 | 880,000,000 | 683,748,690 |
| 23101 | 1,000,000 | 952,663 | 300,000 | 1,021,407 | 2,400,000 | 1,351,389 |
| 23301 | 7,000,000 | 4,370,710 | 3,500,000 | 4,355,806 | 32,000,000 | 20,060,232 |
| 23401 | 12,000,000 | 11,926,050 | 5,000,000 | 8,100,985 | 42,000,000 | 3,825,065 |
| 23501 | 1,200,000 | 598,575 | 200,000 | 389,745 | 3,000,000 | 2,233,553 |

## 2.3 අග්‍රිම හා පොදු තැන්පත් ගිණුම්

### 2.3.1 අග්‍රිම ගිණුම්

අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු 03 ක 2013 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂ එකතුව රු.16,444,460 ක් විය. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | අග්‍රිම ගිණුම් අංකය | 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු. |
| ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව | 7002/0000/00/0281/0012/000 | 74,134 |
| ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව | 7002/0000/00/0140/0013/000 | 15,593,270 |
| නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව | 7002/0000/00/0320/0013/000 | 777,056 |
| එකතුව | | 16,444,460 |

### 2.3.2 පොදු තැන්පත් ගිණුම්

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු 03 ක 2013 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු. 7,222,021,437 ක් විය. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය /දෙපාර්තමේන්තුව | තැන්පත් ගිණුම් අංකය | 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු. |
| අධිකරණ අමාත්‍යාංශය | 6000/0000/00/0015/0023/000 | 4,920,076 |
| අධිකරණ පරිපාලනය | 6000/0000/00/0015/0109/000 | 7,131,266,903 |
| රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0113/000 | 36,184,858 |
| ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0114/000 | 49,649,600 |
| **එකතුව** | | **7,222,021,437** |

## 2 කොටස

-----------

**එක් එක් ශීර්ෂයට අදාල විස්තරාත්මක වාර්තාව**

-----------------------------------------------

### 1. ශීර්ෂය - 110 අධිකරණ අමාත්‍යාංශය

---------------------------------------

### 1.1 විගණන විෂය පථය

----------------------

අධිකරණ අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමණාකරණ විගණන වාර්තාව 2014 සැප්තැම්බර් 26 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149, 150 හා 152 ව්‍යවස්ථාවන් වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 1.3 විගණන නිරීක්ෂණය

---------------------

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව අධිකරණ අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) හා ( ආ) හි දක්වා ඇති පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.6 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) අයවැය විචලනය**

**------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයයක් යටතේ සළසා තිබූ රු.200,000 ක් වූ සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii) වැය විෂයයන් 10 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 25 ත් සියයට 97 ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

**--------------------------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විශ්‍රාම ගිය නිලධාරීන් හතර දෙනෙකුගෙන් අය විය යුතු රු.418,983ක ණය මුදලක් වර්ෂ 03 කට අධික කාලයක සිට අයකර ගැනිමට අපොහොසත් වි තිබුණි.

(ii) වැඩ තහනමට ලක් වූ නිලධාරීන් අටදෙනෙකුගෙන් වර්ෂ 03 කට වැඩි කාලයක සිට අය විය යුතු ණය ශේෂය රු. 576,572 ක් වී තිබුණි.

**1.4 වත්කම් කළමනාකරණය**

**---------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i) බේරුම් නොකළ බැරකම්**

**----------------------------**

අමාත්‍යාංශය විසින් 2013 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු.1,525,741 ක් වී තිබුණි.

**(ii) පාඩු හා හානි**

**--------------**

අවස්ථා 27 කදී සිදුවූ වාහන අනතුරු සම්බන්ධයෙන් එකතුව රු.2,832,405 ක් වූ අලාභ අයකර ගැනීමට හෝ කපා හැරීමට කටයුතු කර නොතිබුණි.

**1.5 කාර්යසාධනය**

**----------------**

අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුවක් වන අධිකරණ පරිපාලන ශිර්ෂය යටතේ 2013 වර්ෂය වෙනුවෙන් රු.මිලියන 4,671 ක් වැය කර තිබුණි. නමුත් ඒ යටතේ දැක්විය යුතු දැක්ම ,

මෙහෙවර කාර්යයන් හා ප්‍රගතිය යනාදි විස්තර පැහැදිලිව හඳුනාගත හැකි පරිදි කාර්යසාධන වාර්තාවට ඇතුළත් කර නොතිබුණි.

## 1.6 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෝෂ්ඨ මට්ටම | 28 | 23 | 05 | - |
| (ii) | තෘතියික මට්ටම | 10 | 08 | 02 | - |
| (iii) | ද්විතියක මට්ටම | 177 | 139 | 38 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 73 | 68 | 05 | - |
| (v) | වෙනත් (කොන්ත්‍රාත්) | - | 02 | - | 02 |
| | **එකතුව** | **288** | **240** | **50** | **02** |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 50 ක් පිරවීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

## 2. ශීර්ෂය 228 - අධිකරණ පරිපාලනය

### 2.1 විගණන විෂය පථය

අධිකරණ පරිපාලන කාර්යාලයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමණාකරණ විගණන වාර්තාව 2014 සැප්තැම්බර් 12 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ

සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරික්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 2.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

---

විසර්ජන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149, 150 හා 152 ව්‍යවස්ථාවන් වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2.3 විගණන නිරීක්ෂණය

---

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව අධිකරණ පරිපාලනයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 2.4 හා 2.5 ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) අයවැය විචලනය

---

වැය විෂයයන් 08 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 7 ත් සියයට 75 ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

### (ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය අනුව රජයේ නිලධාරීන්ට අත්තිකාරම් පාලන ගිණුමේ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.687,957,755

ක් වී තිබුණි. කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව රු.676,193,858 ක් වූයෙන් රු.11,763,897 ක වෙනසක් අනාවරණය විය. ඒ අනුව පාලන ගිණුමේ ශේෂය කේවල ශේෂ එකතුව සමඟ සැසඳිමක් කර නොතිබුණි.

(ii) ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 4.2.4 වගන්තියේ විධිවිධාන ප්‍රකාර නිලධාරියෙකු විශ්‍රාම ගැනීමට නියමිත කල්හි ඔහුගෙන් අයවිය යුතු සියලුම ණය පිළිබඳ විස්තර දෙපාර්තමේන්තු ප්‍රධානියා විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතු බවත්, XXIV පරිච්ඡේදයේ 4.2.5 වගන්තිය ප්‍රකාර නිලධාරියාගේ පරිවර්තික විශ්‍රාම වැටුපෙන් හෝ පාරිතෝෂිකයෙන් හෝ අයකර ගතයුතු බව දක්වා තිබුණත්, ගිණුමේ සඳහන් පරිදි අයවිය යුතු රු.541,870 ක් වූ ණය ශේෂ සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.

(iii) 2013 දෙසැම්බර් 31 දිනට සේවය හැර ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු එකතුව රු.3,749,917 ක් වූ ණය ශේෂ වර්ෂ ගණනාවක සිට දිගින් දිගටම ඉදිරියට ගෙනවිත් තිබූ අතර එම ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iv) 2013 දෙසැම්බර් 31 දින වන විට වැඩ තහනමට ලක් වූ නිලධාරීන්ගෙන් අයවිය යුතු එකතුව රු.7,573,318 ක් වූ හිඟ හිටි ණය ශේෂ අයකරගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

**(ඇ) පොදු තැන්පත් ගිණුම**

2013 දෙසැම්බර් 31 දිනට අධිකරණ කලාප 25 ක තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.7,131,266,904 ක් වූ අතර එම තැන්පත් ශේෂයන්ගේ කේවල ශේෂ උපලේඛන හා කාල විශ්ලේෂණ පිළියෙල කර නොතිබුණි. එබැවින් 2013 දෙසැම්බර් 31 දිනට වර්ෂ 02 ක් ඉක්මවූ තැන්පත් ශේෂයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.“නඩු කටයුතු දීර්ඝ කාලයක් ඉදිරියට ඇදී යාමත් , අධිකරණවල විශාල තැන්පතු ශේෂයන් ප්‍රමාණයක් පැවතීමත් යන කරුණු හේතුවෙන් ඉහත පරිදි මුදල් රෙගුලාසි 571 පරිදි කටයුතු කිරීම කඩිනමින් සිදුකළ නොහැකි වී ඇති බව” අමාත්‍යාංශ ලේකම්වරයා විසින් විගණනයට දන්වා තිබුණි.

**2.4 පාඩු හා හානි**

---------------

අවස්ථා 65 කදී සිදු වූ එකතුව රු.1,288,345 ක පාඩු හා හානි අය කර ගැනීමට හෝ පොත් වලින් කපා හැරීමට හෝ කටයුතු කර නොතිබූණු අතර එයින් රු.752,277 ක් වසර 5 ත් හා වසර 10 ත් අතර කාල පරාසයකට අදාල ඒවා විය.

**2.5 මානව සම්පත් කළමණාකරණය**

----------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව සහ තථ්‍ය සේවක සංඛ්‍යාව**

----------------------------------------------------

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 25 | 14 | 11 |
| (ii) | තෘතියික මට්ටම | 26 | 06 | 20 |
| (iii) | ද්විතියික මට්ටම | 1,008 | 638 | 370 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 3,469 | 2,898 | 571 |
| | **එකතුව** | **4,528** | **3,556** | **972** |

පහත සඳහන් නිරික්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 972 ක් පිරවීමට ආයතනය කටයුතු කර නොතිබුණි."අධිකරණ පරිපාලනයේ සේවක පුරප්පාඩු පිරවීම සම්බන්ධව මෙම අමාත්‍යාංශයට කටයුතු කළ හැකි වන්නේ සේවක මට්ටම් කිහිපයක් සඳහා පමණි. අනෙකුත් සේවක මට්ටම් පිළිබඳව අධිකරණ සේවා කොමිෂන් සභාව හා අදාල ආයතන විසින් කටයුතු කළ යුතුව ඇති බව" අමාත්‍යාංශ ලේකම්වරයා විසින් විගණනය වෙත දන්වා තිබුණි.

**3. ශීර්ෂය 231 - ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව**

----------------------------------------------------------------

**3.1 විගණන විෂය පථය**

---------------------

ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ

කළමණාකරණ විගණන වාර්තාව 2014 අගෝස්තු 28 දින දෙපාර්තමේන්තුවේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 3.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149, 150 හා 152 ව්‍යවස්ථාවන් වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිළධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 3.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඈ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 3.4 හා 3.5 ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) ලේඛන හා පොත්පත් පවත්වාගෙන නොතිබීම.

දෙපාර්තමේන්තුව විසින් 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ විධිවිධාන පරිදි ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙළ කර නොතිබුණි.

### (ආ) අයවැය විචලනය

වැය විෂයයන් 11 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 18 ත් සියයට 68 අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(ඈ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව 2013 දෙසැම්බර් 31 දිනට හිඟහිටි ණය ශේෂයේ වටිනාකම දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පොත් අතර රු.264,955 ක වෙනසක් විය. මුදල් රෙගුලාසි 427 ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් එම ශේෂය භාණ්ඩාගාර පොත් සමඟ සසඳා නොතිබුණි.

**3.4 කාර්යසාධනය**

උකස් බැඳුම්කර සහ වෙනත් නිශ්චල දේපල සම්බන්ධයෙන් ගෙවිය යුතු ණය සම්බන්ධ ආරවුල් නිරවුල් කිරීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්ය වූ අතර විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව 2013 වර්ෂයේ කාර්යසාධනය පහත දැක්වේ.

| | | |
|---|---|---|
| ඉදිරියට ගෙනා නොනිමි ඉල්ලුම්පත් සංඛ්‍යාව | | 533 |
| නව ඉල්ලුම්පත් සංඛ්‍යාව | 453 | - |
| ලැබුණු සමාලෝචන ඉල්ලුම්පත් සංඛ්‍යාව | 31 | - |
| | -------- | 484 |
| | | --------- |
| මුළු ඉල්ලුම්පත් සංඛ්‍යාව | | 1,017 |
| සමථයට පත් කළ ඉල්ලුම්පත් සංඛ්‍යාව | 133 | |
| නිෂ්ප්‍රභා කළ ඉල්ලුම්පත් සංඛ්‍යාව | 157 | |
| සමාලෝචන ඉල්ලුම්පත් සංඛ්‍යාව | 20 | |
| සහතික නිකුත් කළ ඉල්ලුම්පත් සංඛ්‍යාව | 03 | |
| ඉල්ලා අස්කර ගත් ඉල්ලුම්පත් සංඛ්‍යාව | 19 | |
| | -------- | 332 |
| | | ------ |
| **වසර අවසානයේ අවසන් නොවී ඉතිරි වූ ඉල්ලුම්පත් සංඛ්‍යාව** | | **685** |
| | | **===** |

**3.5**

**මානව සම්පත් කළමණාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව සහ තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක | තථ්‍ය සේවක | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|

| | | සංඛ්‍යාව | සංඛ්‍යාව | සංඛ්‍යාව | සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| | ---------------- | ----------- | ------------- | ---------- | ------------ |
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 01 | 01 | - | - |
| (ii) | ද්විතියික මට්ටම | 13 | 08 | 05 | - |
| (iii) | ප්‍රාථමික මට්ටම | 04 | 04 | - | - |
| (iv) | වෙනත්(කොන්ත්‍රාත් පදනම) | - | 01 | - | 01 |
| | | ---- | ----- | ----- | ------ |
| | එකතුව | 18 | 14 | 05 | 01 |
| | | === | === | === | === |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 05ක් පිරවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

**4. ශීර්ෂය 233 - රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව**

**4.1 විගණන විෂය පථය**

රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමණාකරණ විගණන වාර්තාව 2014 අගෝස්තු 15 දින දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනිම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරික්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**4.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149, 150 හා 152 ව්‍යවස්ථාවන් වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍යා ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**4.3 විගණන නිරීක්ෂණය**

**-----------------------**

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුල්‍ය වාර්තා හා පොත් අනුව රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) හා (ආ) හි දක්වා ඇති පොදු නිරීක්ෂණ සහ පහත 4.4 සිට 4.6 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) අග්‍රිම ගිණුම්**

**---------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මුදල් රෙගුලාසි 371(2)(ආ) හි සඳහන් විධිවිධානවලට අනුකූල නොවන ලෙස අවස්ථා 5 කදී නිලධාරීන් 5 දෙනෙකු වෙත රු. 20,000 ඉක්මවූ එකතුව රු.118,400 ක තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.

(ii) නව ගොඩනැගිල්ලට ප්‍රවිශ්ඨවීමේදී අවශ්‍ය සංග්‍රහ වියදම් සඳහා දෙපාර්තමේන්තු නිලධාරියෙකු විසින් ලබාගත් රු.20,000 ක තත් කාර්ය අතුරු අග්‍රිමයකින් කිසිදු වියදමක් නොකර මසකට ආසන්න කාලයක් අත රඳවාගෙන මුළු මුදලම ආපසු පියවා තිබුණි.

**(ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

**--------------------------------------------------------------------------**

(i) දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාරයේ පොත් අතර 1997 වර්ෂයේ සිට පවතින රු.20,660 ක වෙනස හඳුනාගෙන ගැලපීමට කටයුතු කර නොතිබුණි.

(ii) 2007 සැප්තැම්බර් මාසයේ සිට වැඩ තහනම්කර තිබුණු නිලධාරීන් තිදෙනෙකුගෙන් අයවිය යුතු රු.46,054 ක ණය ශේෂ 2013 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.

**4.4 අනුකූල නොවීම්**

**--------------------**

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම.**

**--------------------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නීති, රීති හා රෙගුලාසි වලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම** |
|---|---|---|
| | රු. | |
| (අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | |
| XV පරිච්ඡේදයේ 9.6 වගන්තිය | - | විදේශ සංචාර සඳහා සහභාගී වූ උණුසුම් ඇඳුම් දීමනාව ලබාගත් කිසිදු නිලධාරියෙකු එම ඇඳුම් ලබාගත් බව සහතික කෙරෙන සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| මුදල් රෙගුලාසි 763 | - | භාණ්ඩ ලැබීමේ පත්‍රිකා(GRN) හා භාණ්ඩ රාක්ක පත්‍රිකා (Bin Cards) නඩත්තු කර නොතිබුණි. |
| **(ඇ) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය** | - | දෙපාර්තමේන්තුවේ වාහන සම්බන්ධයෙන් සෑම මාස 06 කට වරක් ඉන්ධන දහනය පිළිබඳව පරීක්ෂා කර නොතිබුණි. |
| **(ඈ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය** | - | හඳුනා ගැනීම, ගිණුම්ගත කිරීම හා වත්කම් පාලනය පහසු කරවනු පිණිස සෑම ස්ථාවර වත්කමක්ම අංකනය කළ යුතු වුවද, දෙපාර්තමේන්තුව සතු ස්ථාවර වත්කම් ක්‍රමානුකූල අංකනයක් සිදු කර නොතිබුණි. |
| **(ඉ) 2004 ජනවාරි 26 දිනැති අංක 2004/පුස/1 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ උපදේශක චක්‍රලේඛයේ 3.1 වගන්තිය** | - | පුස්තකාල පොත් සම්බන්ධයෙන් වාර්ෂික තොග සමීක්ෂණයක් අනිවාර්යෙන්ම කළ යුතු අතර භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය ලබාදෙන වාර්තාව උපදේශන කමිටුවේ නිර්දේශ සහිතව, බලධරයා විසින් මාස 03ක් ඇතුළත ක්‍රියාත්මක කළයුතු වුවත් ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබුණි. |
| **(ඊ) 2013 සැප්තැම්බර් 01 දිනැති අංක sec/2013/07 දරන දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය** | 25,618 | සෑම සේවා නියුක්තිකයෙකුගෙන්ම උපයන විට ගෙවීම් ක්‍රමය යටතේ අඩු කරනු ලබන බද්ද, ඉන් ඉක්බිතිව එළඹෙන මාසයේ 15 දින හෝ ඊට පෙර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කළ යුතු වුවද, අවස්ථා 06 කදී එම බදු ප්‍රේෂණය කිරීම සඳහා මාස 06 ක් ඉක්මවූ කාල ප්‍රමාදයක් සිදු කර තිබුණි. |

**4.5 කළමනාකරණ දූර්වලතා**

පහත සඳහන් කළමනාකරණ දූර්වලතා අනාවරණය විය.

(අ) එදිනෙදා පරිභෝජන ද්‍රව්‍ය ලැබීම් හා නිකුත් කිරීම් පරිගණක ගත කිරිම සඳහා 2013 ජනවාරි මාසයේදී රු.200,000 ක් වැය කර පුද්ගලික ආයතනයකින් මිලදී ගත් පරිගණක මෘදුකාංගය ඉන්වෙන්ට්‍රි ලේඛන සකස් කිරීම සඳහා පමණක් උපයෝගි කර ගෙන තිබුණි.

(ආ) කල් ඉකුත්වූ බවට නිශ්චය කරන ලද හා භාවිතයෙන් ඉවත් කර තිබුණු රසායන ද්‍රව්‍ය බැහැර කිරීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

(ඇ) 2012 භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව විනාශ කළ යුතු පොත් 307 ක්, සංරක්ෂණය කළ යුතු පොත් 1,629 ක්, බැඳිය යුතු පොත් 343 ක් සහ යල්පැනගිය පොත් 431 ක් හඳුනාගෙන තිබූ අතර ඒ සම්බන්ධයෙන් කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඈ) දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධාරීන්ගේ බඳවා ගැනීමේ පටිපාටිය ප්‍රකාරව ලබාගත යුතු පශ්චාත් උපාධි සඳහා සිදුකළ වියදම ප්‍රතිපූර්ණය කිරීමේදී දෙපාර්තමේන්තුව හා නිලධාරින් අතර විධිමත් බැඳුම්කරවලට එළඹ නොතිබුණි.

(ඉ) 2010 ඔක්තෝබර් 2 දින පශ්චාත් උපාධි පාඨමාලාවන් සඳහා විදේශ ගතවී එම පාඨමාලාව අතහැර 2011 පෙබරවාරි 2 දින ආපසු පැමිණ තිබූ නිලධාරීයෙකුගෙන් එම පාඨමාලාව සඳහා රජයෙන් වැය කරන ලද රු.2,612,867 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.6 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 85 | 71 | 14 |
| (ii) | තෘතියික මට්ටම | 06 | 03 | 03 |
| (iii) | ද්විතියික මට්ටම | 113 | 47 | 66 |
| (iv) | වෙනත් (අනියම් /තාවකාලික/කොන්ත්‍රාත් පදනම) | 74 | 51 | 23 |
| | **එකතුව** | **278** | **172** | **106** |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු වී තිබුණු තනතුරු 106 ක් පිරවීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

**5. ශීර්ෂය 234 - ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්**

---

**5.1 විගණන විෂය පථය**

---

ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා , සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 සැප්තැම්බර් 12 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනිම් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලොචනය සහ ගනුදෙනුවල නියැදි පිලිබඳ තහවුරු පරික්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් කාලවේලා සීමාවන්ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**5.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම.**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන් වෙනත් ව්‍යවස්ථාපිත වධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකිමට ඇතුළත් වේ.

**5.3 විගණන නිරීක්ෂණය**

---

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 5.4 සිට 5.6 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛ ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

**(ආ) අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ .

(i) වැය විෂයයන් තුනක් සඳහා සළසා තිබුණු එකතුව රු.700,000 ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii) වැය විෂයයන් 06 ක් සඳහා එකතුව රු.4,200,000 ක් අධිප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් එම ප්‍රතිපාදන උපයෝජනය කළ පසු ඉතිරිය රු.3,609,276 ක් වී තිබුණි. එය එම වැය විෂයයන් සඳහා සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 53 සිට සියයට 98 දක්වා වූ පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ .

(i) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් පාලන ගිණුමේ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය දෙපාර්තමේන්තු පොත් අනුව රු.29,940,807 ක් වී තිබුණු අතර භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව ශේෂය රු.29,872,562 ක් වී තිබුණි. ඒ අනුව රු.68,245 ක වෙනසක් අනාවරණය වී තිබුණත්, දෙපාර්තමේන්තුව විසින් මුදල් රෙගුලාසි 427 ප්‍රකාරව සසඳා නිවැරදි කිරීමට අපොහොසත් වී තිබුණි.

**(ii)** 2013 ජනවාරි 08 දින වැඩ තහනම් කර තිබුණු නිලධාරියෙකුගෙන් රු.77,560 ක ණය ශේෂයක්ද, ස්ථාන මාරු වී ගිය නිලධාරියෙකුගෙන් රු.3,750 ක ණය ශේෂයක්ද, විශ්‍රාම ගිය නිලධාරියෙකුගෙන් රු.1,500 ක ණය ශේෂයක් හා 2012 ජූලි 24 දින සිට සේවය අතහැර ගිය නිලධාරියෙකුගෙන් රු.120,480 ණය ශේෂයක්ද වශයෙන් එකතුව රු.203,290 ක ණය ශේෂ 2013 දෙසැම්බර් 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි.

## 5.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2013 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

**5.5 බේරුම් නොකළ බැරකම්**

දෙපාර්තමේන්තුව විසින් 2013 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම්වල එකතුව රු.451,315 ක් විය.

**5.6 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත දක්වේ.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව | අතිරික්ත සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 09 | 05 | 04 | - |
| (ii) | තෘතියික මට්ටම | 29 | 19 | 10 | - |
| (iii) | ද්විතියික මට්ටම | 141 | 134 | 07 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 123 | 111 | 12 | - |
| (v) | වෙනත්(කොන්ත්‍රාත් පදනම) | - | 06 | - | 06 |
| | **එකතුව** | **302** | **275** | **33** | **06** |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 33 ක් පිරවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

**6. ශීර්ෂය 235- නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව**

**6.1 විගණන විෂය පථය**

නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත් , ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමණාකරණ විගණන වාර්තාව 2014 අගෝස්තු 28 දින දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ

සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 6.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149, 150 හා 152 ව්‍යවස්ථාවන් වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 6.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) හි සඳහන් පොදු නිරීක්ෂණය සහ පහත 6.4 ඡේදයේ සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) එක් වැය විෂයයක් සඳහා සළසා තිබූණු රු.50,000 ක් වූ සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ii) වැය විෂයයන් 06 ක් සඳහා අධිප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 29 සිට සියයට 98 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි

**6.4 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 4 | 3 | 1 |
| (ii) තෘතියික මට්ටම | 2 | 1 | 1 |
| (iii) ද්විතියක මට්ටම | 15 | 7 | 8 |
| (iv) ප්‍රාථමික මට්ටම | 8 | 7 | 1 |
| **එකතුව** | **29** | **18** | **11** |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 11 ක් පිරවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.